# ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය

ජාතියේ සමාජ–ආර්ථික සංවර්ධනයෙහිලා ජල සම්පත් සංවර්ධනයට කිනම් කාර්ය භාරයක් කළයුතුව ඇත්ද? ඕනෑම රටක වැසියන් වඩාත්ම උවමනාවෙන් අපේක්ෂා කරන දේවල් අතර ආර්ථිකයේ වර්ධනය, එහි ස්ථායිතාව, ආර්ථික හා සමාජයීය සුරක්ෂිත බව, සාධාරණත්වය හා නිදහස යනාදි ඒවාවේ.

ආර්ථික වර්ධනය යනු ජාතික ආර්ථිකයෙහි ඒක පුද්ගල නිෂ්පාදනය වැඩි කිරීම හා එමගින් රටවාසීන් ගේ ජීවන තත්ත්වය නගාලීමයි. ආර්ථික හා සමාජයීය සුරක්ෂිත බව නම් සාගත, විනාශකාරී ජල ගැල්මවල් සහ නියඟ, දරුණු රැකියා වියුක්තිය යනාදිය පිළිබඳ බිය හා අනියත බව තුරන් කර ලීමයි. ආර්ථික සාධාරණත්වය නම් ජාතික ආදයම ජනතාව අතර සමානාත්මක අන්දමින් බෙදීයාමයි.

මේ ඉලක්කයන්ට ළඟාවීමට ඇති එක් ප්‍රධාන මගක් වශයෙන් ජල සම්පත් සංවර්ධනය කිරීමේ වැදගත්කම දැන් කවුරුත් පිළිගන්න දෙයක්. උදහරනයක් හැටියට ගමු ජල විදුලි බලය. එය අද ආර්ථික වර්ධනය සහ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන යාමට හේතුවන මූලික කාරකයක්. ජල ගැලීම් පාලන කරන ව්‍යාපාර ජීවිත හා දේපල රැක ගැනීමෙන් ආර්ථික සහ සමාජයීය ආරක්ෂාව සපයයි. ස්ථිර සැපයුමක් ඇති වාරිමාර්ග ජලය දිගු කාලිනව ඇතිවන ඉඩෝරයන් ගෙන් බෝග වලට වන හානි වලක්වන අතර, එය ඉඩමේ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකර රටේ ආහාර සැපයුම ස්ථාවර කරයි. ජල සම්පාදන, ජලාපවහන සහ කසල දිය බැසයාමේ පද්ධතියක් යහපත් පරිසරයක් පවත්වා ගැනීමට උපයෝගී වන අතර, එය මහජන සෞඛ්‍ය රැක දීමෙන් දීගුකාලීනව ආර්ථික සංවර්ධනයට තුඩුදෙයි. එබැවින් අවසාන වශයෙන් ජල සම්පත් සංවර්ධනයේ දී රජය මගින් එහි වියදම් වැඩි කොටසක් අනියම් මගකින් වුවත් දැරීම ඇත්ත වශයෙන් ආදයම පොදු ජනතව අතර බෙදියාමක් ඇති කරවන මාර්ගයක් බව සඳහන් කරන්න පුළුවන්.

ජල සම්පත් සංවර්ධනයේදී විදුලි බලය සහ වාර්මාර්ග දියුණු කිරීමට තිබෙන ඉඩ ප්‍රස්ථා කර්මාන්ත සහ කෘෂිකර්ම සංවර්ධනයට රුකුල් දෙනවා. මෙය රටේ ජනතාවගේ ආදයම් ඉහළ නැංවීමට අත්‍යවශ්‍ය කරුණක්. එබඳු කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවල සංවර්ධනය, ජල සම්පත් සමාජ ශුභ සාධනයට පරිවර්තනය කිරීම මං සලස්වන අතර, එම කාර්යයන්හි දී අධ්‍යාපනය, ශ්‍රම බලය වර්ධනය, නිවාස සහ ප්‍රජා පහසුකම්, සමාජ ශුභ සාධන සේවාවන් ජල සම්පත් සංවර්ධන වැඩ සටහනකට වැදගත් සහායක සේවාවන් ලෙස එක් කළ හැකිය.

දැන් අපගෙන් ඇසිය හැකි ප්‍රශ්නයක් නම මෙතෙක් අප නිම කර ඇති ජල සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් කිවයුතු දෑ කවරේද යන්නයි. පසුගිය කාලයේදී අප කටයුතු කරන ලද්දේ ඒක කාර්ය සැලසුම් යෝජනා ක්‍රම උදෙසා වන අතර බොහෝවිට මෙවා වාරිමාර්ග අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වූ ඒවායි. මෙම යෝජනා ක්‍රමයන්හි ප්‍රධාන කාර්ය වාරිමාර්ග ජලය සැපයීම වන අතර ඊට අනුබද්ධ ගැටළුවූ ගං වතුර පාලනය, ඉඩම් සංවර්ධනය, ජල විදුලිය නිපදවීම, පස සහ වනාන්තර සංරක්ෂණය යනාදී ගැටළු සම්බන්ධයෙන් දක්නට තිබුනේ ඒකාබද්ධ වූ වැඩපිළිවෙලක් නොවේ. එම කාලයේ ජල සම්පත් සංවර්ධනයේදී දක්නට තිබූ දෙවැනි අඩුපාඩුව සැලසුම් ක්‍රියාවලියේදී සමාජමය සාධක ගැන නොසැලකීමයි.

කෙසේ වුවද, මෑත කාලයේ එම අඩුපාඩුකම් දුරලීමට පියවර ගෙන ඇති අතර ජලාශ සංවර්ධනයට එළඹිය යුතු නිවැරදි මග අනුව ඉදිරියෙහි දී කටයුතු සිදුවන තැනට දැන් පියවර ගෙන ඇත. උදහරණයක් හැටියට මෑතදී ආරම්භ කළ මහවැලි සංවර්ධන

යෝජනා ක්‍රමය පිළිබඳ 1966 දී එක්සත් ජාතීන් සංවර්ධන වැඩසටහන මගින් කළ සැලැස්ම ඊට පෙර 1958 දී ඇමරිකා එක්සත් ජනපදයේ සහාය ඇතිව කරන ලද අන්තර් ද්‍රෝණි යෝජනා ක්‍රම සැලැස්මත් සංසන්දනය කරමින් සලකා බැලිය හැකිය.

කලින් කළ සැලැස්මේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්සත් ජනපදයේ මෙරට සිටි ක්‍රියාකාරී කණ්ඩායමත් එක්ව බහු කාර්ය මඟ අනුව ව්‍යාපාරය සැළසුම් කළත් අවසාන වශයෙන් එයින් යෝජිත වූයේ දැනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ බොහෝ දුරට අංගමැඩිල්ල – එළහැර – කන්තලේ යෝජනා ක්‍රමයෙන් පෝෂිත ප්‍රදේශවල එවකට පැවති කුඹුරු අක්කර 325,000 කට වාරිමාර්ග ජලය සැපයීමටත්, මෙගාවොට් 60 ක් නිපදවන ජල විදුලි බලාගාර ඇති කිරීමටත්ය.

අනිත් අතට වඩා පුළුල් සංවර්ධන සැලැස්මක් මෙම කර්තව්‍යයට බැස්ස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ විශේෂඥයින් අතින් ඉටුවනු දක්නට ලැබේ. එහිදී මුලින්ම මහවැලි ගංගා ද්‍රෝණියේ ඇති සම්පත්වල වට්ටෝරුවක් සම්පාදනය කළ අතර, එයින් පෙනී ගියා මහවැලි ද්‍රෝණියෙහි අවශ්‍යතාවලට වඩා ජලය ප්‍රමාණයක් එහි දක්නට ලැබෙන බව. ඒ හේතුකොට ගෙන මෙම ද්‍රෝණිය උදෙසා සැලසුම් පිළියෙල කිරීමේදී අනිත් සම්පත්වල උපරිම උපයෝගිතාවයක් ගෙන දිය හැකි අන්දමට සැලසුම් කටයුතු කළා. එහිදී මදුරු ඔය ද්‍රෝණියත්, උතුරු මැද පළාත් කලින් සංවර්ධන කටයුතු සිදු කොට තිබූ සෙසු ගංගා ද්‍රෝණිත් ඇතුළත් වන මහා ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මක් බවට එය පත් වුනා.

මෙහිදී ඔබට පෙනී යනවා මෙලෙස නවීන ක්‍රම අනුව ජල සම්පත් සැලසුම් කිරීමේ දී ලංකාවේ විශාලතම ගංගා ද්‍රෝණියෙහි ප්‍රධාන සැලැස්මට අනුව මේ ලෙස සංවර්ධනය වන භූමි ප්‍රමාණය ශ්‍රී ලංකාවේ භූමියෙන් සියයට හතලිහක් පමණ වන බව

කලින් වූ කුඩා ප්‍රමාණයේ සංවර්ධන යෝජනාව මෙන් නොව මෙහි අදියර වශයෙන් සංවර්ධනය කිරීමට සකස් කර ඇති සැලසුමට අළුතින් අක්කර 650,000 කටද වාරිමාර්ග සැපයිය හැකිවාක් මෙන්ම දැනට පවතින අක්කර 250,000 කට ද ජලය සැපයියහැකිව ඇත.

ජල විදුලි බලය සංවර්ධනයේදී ඇඳින ගෙන ඇගයුම් කර ඇති හැම ජල විදුලිබල ඒකකයකින්ම උත්පාදන කළ හැකි විදුලි



ජල විසිරවන වාරිමාර්ග යන්ත්‍ර යොද ගොවිතැන් කිරීමෙන් මූලික ප්‍රාග්ධන වියදම වැඩි වුවත් හිඟ සම්පතක් වූ වාරිමාර්ග ජලය අරපරෙස්සමෙන් භාවිත කිරීමට පුළුවන්. එහිදී ජල ඒකකයකින් වගා කර හැකි බිම් ප්‍රමාණය ගුරුත්ව වාරිමාර්ග ක්‍රමයට වඩා බෙහෙවින් වැඩිය.

**ජල සම්පත්වල සංවර්ධනය උදෙසා සැලසුම් කරනවිට ඒවා රටේ විවිධ වූ අනෙකුත් කටයුතුවලට බලපාන අන්දම ගැනත් සැලකිලිමත් විය යුතුය.**

බලය ඉදිරි දශකය හෝ දෙක තුළ රටේ අවශ්‍යතාවයන්ට වඩා බෙහෙවින් වැඩිය. එම නිසා අදියර අනුව සංවර්ධනය කෙරෙන වාරිමාර්ග වැඩ සටහනට අනුව අවශ්‍ය වන්නාවූත් සහ වකවානුවට රටේ විදුලි බල අවශ්‍යතාවයන් සපුරා ලන්නාවූත් බහු කාර්ය ඒකක පමණක් මහා සැලැස්මේ අඩංගු කර ඇත.

මෑතදී කළ සැලසුම්වල තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ ගංගා ද්‍රෝණි සංවර්ධන සැලසුම් කරන පියවරෙහි දී අත්‍යවශ්‍ය බහු කාර්ය ප්‍රවේශයකින් ඊට එළඹීමයි.

ගංගා නිම්නයක සංවර්ධන හැකියාවන් නිගමනය කිරීමටත්, ඒවා විවිධ ඉංජිනේරු වැඩ සටහන් මගින් විවිධවූ කාර්යයන් සැලසීමට පෙර එම ද්‍රෝණියේත් එමෙන්ම රටේත් අදත් හෙටත් වන අවශ්‍යතා සොයා බලා කටයුතු කළයුතුය.

මෙතෙක් අප ජල සම්පත් උපයෝගී කර ගෙන ඇත්තේ වාරිමාර්ග, ජල විදුලිය උත්පාදනය, ගංගා සහ කර්මාන්තවලට ජලය සැපයීම, යනාදිය පිණිසයි. මේ අතර රට පුරාම විවිධ මට්ටමින් ආර්ථික වර්ධනයක් ඇති වී ගෙන යන අතර සමහර ප්‍රදේශ ප්‍රධාන කෘෂිකාර්මික හෝ කර්මාන්ත මධ්‍යස්ථාන හැටියට සංවර්ධනය වී තිබේ. ඒ අන්දමේ සිදුවී ගෙන යන සංවර්ධන ක්‍රියාවලිය හේතුකොට ගෙන තිබෙන ජල හා ඉඩම් සම්පත්වලට අළුතින් අතිරේක ඉල්ලුමක් ඇති වනු ඇත.

ජල සම්පත් සමග ඇති ප්‍රශ්නයක් නම් ගංවතුරට ලක්වන පහත් බිම්වල සිදුවෙමින් යන සීඝ්‍ර සංවර්ධනය හේතුවෙන් ගංවතුර ප්‍රශ්නය එන්න එන්න බැරෑරුම් වීමයි. එවැනි අවශ්‍යතාවයන් ගෙන් ඇතිවන ගැටළු තේරුම් ගැනීමට රටේ විවිධ පළාත්වල ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි අතීතය, වර්තමානය මෙන්ම අනාගතයත් සලකා බැලිය යුතුය.

එමනිසා පුළුල් සැලසුමකට අවශ්‍යයෙන් කළයුතු දෙයක් වන්නේ ආරම්භයේදීම අනාගතයේ රටේ මුළු ජල අවශ්‍යතාවය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමයි. මේ අනුව ප්‍රාග්ධන සම්පත් ඇතුළුව රටේ හැම සම්පතක් ම විවිධ කාර්යයන්ට විස්තරාත්මක සැළැස්මකින් කළහැකි වේ.

මෙයට අමතරව යෝජිත ව්‍යාපාරයේ දී මුහුණ පෑමට ඉඩ තිබෙන වාරිමාර්ග, ජල විදුලිය, ගංවතුර පාලනය සහ ජලය සම්බන්ධ ක්‍රියාකාරිකම් වල දී පැන නැගිය හැකි ප්‍රශ්න ගැන සාමාන්‍ය හැඟීමක් පැවතීම සැලසුම් කිරීමේදී අත්‍යාවශ්‍ය ආධාරයක් වනු ඇත.

මෙම කරුණු හැමෙකක්ම පාහේ ඒ සම්බන්ධ කටයුතු කරන රජයේ දෙපාර්තමේන්තු හා ආයතනවල අවධානය යොමු වී පවතී. මෙහි දී වඩා වැදගත් යැයි සැලකෙන කරුණු කිහිපයක් ගැන පහත සලකා බැලේ.

## වාරිමාර්ග ක්‍රම

ජලය භූමි සම්පතට වඩා හිඟයි. එහෙයින් ජල සම්පත් සැලසුම්කරණයේදි අරමුණ විය යුතු වන්නේ ජල ඒකකයකින් ලබා ගත හැකි ප්‍රශස්ථ නිෂ්පාදනය කවරක්ද යන්නයි. නවීන වාරිමාර්ග ක්‍රම උපරිම ආර්ථික නිෂ්පාදනයක් උදෙසා හැකි ඉක්මණින් යොදා ගත යුතුයි. එහිදීද අනාගතයේ වෙනස්වන ආර්ථික තත්ත්වයන්ට අනුව සිදු විය යුතු උචිත හැඩ ගැසීම් පිළිබඳ සැළකිල්ලක් දැක්විය යුතුය.

උදාහරණයක් හැටියට දූන් මහවැලි ව්‍යාපාරය යටතේ තීරු හෝ ඇළි සහ වේළි ආකාරයේ වාරිමාර්ග ක්‍රම අනුව ජලය යොදා ගැනීමට

වෙන්කර ඇති ප්‍රදේශවල ඉඩම්වලට අනාගතයේ ජල විසුරුම් යන්ත්‍ර මගින් සපයන වාරි මාර්ග ක්‍රමයක් යොදා ගත හැකි වනු ඇත. මෙය සිදුවිය හැක්කේ දේශීයව ජල විසුරුම් වාරිමාර්ග යන්ත්‍ර (ස්ප්‍රින්ක්ලර්ස්) අපටම නිපදවිය හැකි වූ අවස්ථාව වන විට හා අපගේ ගොවි මහතුන් උසස් මට්ටමේ කෘෂි කාර්මික ඵලදයිතාවය කට එළඹ ඔවුන්ගේ වැඩිවන ආදයමින් විදුලි මගින් ක්‍රියා කරන කුඩා පොම්ප සහ අනෙකුත් අවශ්‍ය උපකරණ ලබා ගැනීමට හැකි තත්ත්වයක් ඔවුන්ට ඇති වූ විටත්ය.

එමනිසා අසංවර්ධිත ගංගා ද්‍රෝණි සංවර්ධනය කිරීමේ කටයුතුවල සැලසුම් අවස්ථාවේදී ජලය හා අනෙකුත් සම්පත්වලද උපරිම උපයෝගිතාවයක් ලබා ගැනීමට එම කරුණු සිත්හි තබා ගතයුතුය. ඒවා හේතු කොට ගෙන අකාර්යක්ෂමවූ ගුරුත්ව වාරි මාර්ග යටතේ ජලය සැපයීමට නොහැකි හේතුවෙන් සමහර විට සංවර්ධන සැලැස්මෙන් ඉවත් කළහැකි ඉඩම් ජල විසුරුම් වාරිමාර්ග ක්‍රමය යටතේ සංවර්ධනය කොට ගත හැකි බව පෙනී යනවා ඇත.

## භූගත ජලය

අප බොහෝදුරට මේ දක්වා වාරිමාර්ග උදෙසා යොදා ගෙන ඇත්තේ මතුපිට ගලා යන ජල සම්පත්ය. මෙය මෙහි ඇති විපුලතාවය නිසා සිදු වූවා විය හැකිය. භූගත ජලය පිළිබඳ සොයා ගැනීමට පුළුල් පරීක්ෂණ ආරම්භ කරන ලද්දේ මෑතදීයි. එහි වර්තමාන අපේක්ෂාවන් වන්නේ භූගත ජලය වැඩිමනත් ඇති ප්‍රදේශවල එම ජලය උපයෝගී කර ගෙන, තෝරා ගත් භෝග වගා කිරිමයි.

පසුගිය කාල වල ජලය පාවිච්චි කෙරුණු පිළිවෙත් අනුව සලකා බැලූවිට අවදානමක් දැරීමක් වූවත් සෑහෙන කාලයකට රටේ පොළව මතුපිට ඇති ජල සම්පත්වල හිඟයක් ඇති නොවේ යැයි පැවසිය හැකිය. කෙසේ වූනත් වර්තමානයේ කෙරීගෙන යන භූගත ජල සම්පත් පරීක්ෂණ වලට අනුව මතුපිට ජලය හා භූගත ජලය ඒකාබද්ධව වාරිමාර්ග කටයුතු උදෙසා යොදා ගැනීමේ නවීන ක්‍රම අනුව කරන්නේ නම් එය අපගේ ප්‍රයෝජනය සඳහා වනු ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ එක් එක් ගංගා ද්‍රෝණියේ මෙම පංති දෙකටම අයිති ජල සම්පත් වල වට්ටෝරුවක් මින් ඉදිරියට සකස් කිරීමෙන් ඒවා ඒකාබද්ධව ප්‍රයෝජනවත් කර ගැනිමට උදව් වන බවයි.

තවත් එබඳුම නූතන අදහසක් නම් ගංගා ද්‍රෝනිවල ඉහළ වගා ප්‍රදේශවලින් බැසයන වාරිමාර්ග ජලය නැවත ප්‍රයෝජනවත් කර ගැනිමට ඇති හැකියාව අධ්‍යයනය කිරිමයි. මෙලෙස වාරිමාර්ග සැලසුම් කිරීමේදී වාරිමාර්ග ජලය නැවත නැවත පාවිච්චියට ගැනීමෙන් විපුල ප්‍රතිඵල අනාගතයේ දී ලබා ගත හැකි වනු නොඅනුමානයි.

## ජල විදුලි බලය

අනාගතය උදෙසා ජාතික බල ශක්ති අංශය සංවර්ධනය කිරීමේ දී ජල විදුලි බලය සංවර්ධනය වැදගත් කාර්යක් වන්නේ විශේෂයෙන්ම රටෙහි දුර්වල ගෙවීම් ශේෂය පිළිබඳ තත්ත්වය සළකා බලන විටයි. වර්තමාන සංවර්ධන රටාවට අනුව බලය සඳහා ඇති ඉල්ලුම සලකා බැලීමේදී හැම අවුරුදු 3–4 කට වරක්ම මෙරට විදුලිබල ජාලකයට අළුතින් බලාගාරයක් එක් කළයුතුව ඇත.

තාප විදුලි බලාගාරයක් සවි කිරීමට වැය වෙන මූලික ප්‍රාග්ධන. වියදමට අමතරව, ඊට අවශ්‍ය ඉන්ධනවලට වැය කෙරෙන විදේශ විනිමය යනාදිය සලකා බැලීමේදී විශාල පරිමාණ තාප විදුලි බල ජනනය කිරීමට සිත් යොමු කරන්නට පෙර ජල විදුලි බලය මෙරට දියුණු කර ගන්නට ඇති ඉඩ ප්‍රස්ථා හැමෙකක්ම අප ප්‍රයෝජනයට යොදාගෙන ඇතිද යන්න සැළකිල්ලට යොමු කළයුතුයි.

කැළණි ගංගා ද්‍රෝණියෙහි ඒක - කාර්ය විදුලි බලාගාර හැරෙන්නට නුදුරු අනාගතය උදෙසා සලකා බලා ඇති හැම බලාගාරයක්ම විශාල වේලිවලින් යුතු බහු කාර්ය යෝජනා ක්‍රමය. ඒවා දිගුකාලීනව වාරි මාර්ග සංවර්ධනයෙහි ලා අවශ්‍ය ජල පාලනය ප්‍රධාන කාර්යය කොටගත් ව්‍යාපාරයන්ගෙන් සංයුක්ත වූ ඒවාය. මෙය විශේෂයෙන් මහවැලි මහා සැලැස්ම සම්බන්ධව විශේෂයෙන් කැපී පෙනෙන්නේ එහි ජල

විදුලි බල සංවර්ධනය, මහවැලි සැලසුම් ක්‍රියාත්මක කිරීමේ පළමු අදියර දෙකෙහි වාරිමාර්ග ජලය සැපයුම උපරිම කිරීමේ අරමුණ අනුව කටයුතු කරමින් සිදු කරන ලද්දක් නිසාය.

එම හේතුවෙනු මහවැලි මහා සැලැස්ම යටතේ සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවේශමෙන් සැලසුම් කොට අදියර ගත කොට ඇත්තේ රටේ බල ශක්ති ඉල්ලුම් අනුක්‍රමයෙන් සපුරාලන අතර අළුතින් වාරිමාර්ග ජලය සපයන ප්‍රදේශ පුළුල් කිරීමටත්ය.

## ජලගැලීම් පාලනය

ලංකාවේ තෙත් කලාපයේ ගංගා ද්‍රෝණි වල පවතින ජල ගැල්මවල් පිළිබඳ ගැටළුව සම්බන්ධව පසුගිය දශක කිහිපය තුළම වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කර තිබේ. ලෝකයේ වෙනත් ප්‍රදේශවල මෙන් ලංකාවේ ද ජල ගැලීම් පාලනය කිරීමේදී හුදෙක් ආර්ථිකය කරුණු පදනම් කොට සැලකීම හේතුකොට ගෙන අප ගේ කටයුතු හුදෙක් සම්ප්‍රදායික අන්දමට කරන ගඟ දෙපස වේලි බැඳීමට පමණක් සීමා වී ඇත. මෙයින් එම පළාත්වල ජනතාව අපේක්ෂා කරන අන්දමේ ආරක්ෂාවක් සැලසෙන්නේ නැති අතර, ආරක්ෂිත ප්‍රදේශ තුළ එකතු වන ගං වතුර බැස යාමට ඇති ඉඩකඩ දැන් සීමාවීම අළුත් ප්‍රශ්න මතු කිරීමට ද හේතු වී ඇත.

මෑත කාලයේ සිට මෙයට වඩා වියදම් සහිත වූ ගං වතුර රඳවන ජලාශ තැනීම පිළිබඳව දැන් අවධානය යොමු වී තිබේ. තාක්ෂණික මතය අනුව කැළණි ගංගා, කළු ගංගා ද්‍රෝණිවල ජල ගැලීම් පාලනය කිරීමට හා ජල විදුලි බලය නිපදවීමට හැකි බහු කාර්ය ජලාශ ගොඩ නැගිය හැකි බවට මෑතදී කල අධ්‍යයනයන් මගින් හෙළි කර ඇත. අවසානාවකට මෙන් මෙම ගංගා ද්‍රෝණිවල ඇතිවී තිබෙන ආර්ථික දියුණුව නිසා ඉඩම් බෙහෙවින් සංවර්ධිතය. විශාල ජලාශ ගොඩ නැංවීමේදී එම වටිනා ඉඩම් යටවී යැම වැලැක්විය හැකි නොවන නිසා ඒ අන්දමේ ජලාශ ගොඩ නැංවීමේ අදහස් සමහරක් ඉවත දැමීමට හේතුවී ඇත.

ඉංජිනේරු විද්‍යාවෙන් බාහිරව කළ හැකි ජල ගැලීම් ප්‍රදේශ වෙන් කිරීමට ජල ගැලීම් වලට මානව හැඩ ගැසීමක් ඇති කිරීම අවසාන වශයෙන් මීට කළ හැකි ප්‍රතිකර්ම යක් වුවද, දැනට දක්වා ඇති කරුණු අනුව එබඳු පියවරවල් ගිං සහ නිල්වලා ගංගා ද්‍රෝණිවල පමණක් වුවද ගැනීම වැදගත්. කෙසේ වුවත් ලෝකයේ කුමන රටක වුවත් ජල ගැලීම්වලින් වන හානිය වැලැක්වීමට කටයුතු කිරීම තවමත් ඉතා සංකීර්ණ ප්‍රශ්න යක්.

## නිවෙස්වලට ජලය

අද දිවයිනේ ජනගහණයෙන් හතරෙන් තුන් කොටසක්ම ග්‍රාමීය ප්‍රදේශවලයි ජීවත් වන්නේ. ඔවුන් හැම දෙනෙක්ම පාහේ ඔවුන් ගෙ ගෘහ අවශ්‍යතා පිරිමසා ගන්නේ පෞද්ගලික හෝ පොදු ළිං මගිනුයි. මුළු ජනගහණයෙන් 16% ක් පමණ වන දශ ලක්ෂ 2 ක් ජීවත් වන කොළඹ සහ අනෙකුත් නගරවල ජනතාවට පමණක් ජලනල මගින් ජලය සපයනු ලැබේ.

ජනගහණය සීඝ්‍රයෙන් වර්ධනය වේ. ඒ අතර පෞද්ගලික සනීපාරක්ෂක කටයුතුවල මට්ටම ඉහළ යැම නිසා ඒක පුද්ගල ජල පරිහරණය වැඩිවීමෙන් දැනට වඩා අනාගතයේදී ගෘහ අවශ්‍යතාවයන් සඳහා වුවමනා ජලය ප්‍රමාණයෙහි විශාල වැඩිවීමක් ඇති වනු ඇත.

මෙතෙක් ජල සම්පාදන සැලසුම් කරුවන් ප්‍රධාන වශයෙන් ඔවුන්ට අවධානය යොමු කළේ අධික ජනගහනයකින් යුත් නගර සම්බන්ධයෙනුයි. ඇත්ත වශයෙන් දැනට ඇති එකම දිගු කාලීන පොදු ජල සම්පාදන සැලැස්ම සකසා ඇත්තේ මීගමුව සිට ගාල්ල දක්වා ඇති පටු මුහුදු බඩ තීරයටයි.

(ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පැවති දේශනයක් ඇසුරෙන් සකස් කෙරිණි)